**CRTM - 766**

**RTM** 358/17.08.11

නි.පො.ප / විනය හා කල්ක්‍රියා,
නීති දිසාව ගෙන්,

: සියළුම ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්,
සියළුම නියෝජ්‍ය පොලිස්පතිවරුන්,
සියළුම කොට්ඨාස භාර නිලධාරීන්,
සියළුම අධ්‍යක්ෂවරුන්,
සියළුම දිස්ත්‍රික් භාර පො.අ/ ස.පො.අ වරුන්,
සියළුම මූ.පො.ප/ ස්ථානාධිපතිවරුන් වෙත.

**<u>හොරතුරු පොත් හා ලේඛණ විනාශ කිරීම සම්බන්ධව.</u>**

පොලිස් නියෝග ඛ 8 අනුව ලිපිලේඛණ, ජධා තබා ගැනීම හා විනාශ කිරීම සම්බන්ධව උපදෙස් ඇත.

එසේ වුවද, 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ **7:3** වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

**7:3** (අ) "මේ පනත ක්‍රියාත්මක වීමේ දිනයේ දී එවකටත් පවතින වාර්තා සම්බන්ධයෙන් වන විට, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට අවුරුදු 10 කට නොඅඩු කාලසීමක් සඳහා" සහ.

**7:3** (ආ) "මේ පනත ක්‍රියාත්මක වීමෙන් පසුව සකසනු ලබන අළුත් වාර්තා සම්බන්ධයෙන් වන විට, එම වාර්තාව සකස් කල දින සිට අවුරුදු 12 කට නොඅඩු කාලසීමාවක් සඳහා"
ආරක්ෂා කරනු ලැබිය යුතුය.

ඒ අනුව, තොරතුරු පොත් හෝ වෙනත් ලේඛණ විනාශ කිරීමට අදාල, පොලිස් නියෝග ඛ 8 සඳහා පූර්ණ සංශෝධනයක් කල යුතුව ඇත. ඊට අදාලව පොලිස්පති චක්‍රලේඛයක් නිකුත් කිරීමට ඉදිරියේ දී කටයුතු කරනු ලබන අතර එතෙක් පොලිස් තොරතුරු පොත් හා ලේඛණ සම්බන්ධයෙන් ඉහත පනතේ **7:3** වගන්තිය අනුව ක්‍රියාකරන ලෙසට දැනුම් දෙමි.

මූ.පො.ප / ස්ථානාධිපතිවරුන් විසින් උපදෙස් පන්ති වාර 03 කදී, ඉහත කරුණු සම්බන්ධයෙන් සියළුම නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කල යුතුය.

2017/08/11

**නියෝජ්‍ය පොලිස්පති,**
**විනය හා කල්ක්‍රියා, නීති දිසාව.**
**පොලිස්පති වෙනුවට.**

අජිත් රෝහණ
එල්.එල්.එම්., එල්.එල්.බී. නීතිඥ
ප්‍රසිද්ධ නොතාරිස්, දිවුරුම් කොමසාරිස්.
නියෝජ්‍ය පොලිස්පති
විනය හා කල්ක්‍රියා, නීති දිසාව
පොලිස් මූලස්ථානය
කොළඹ 01